# නුවරඑළිය මහා නගර සභාව

## නුවරඑළිය දිස්ත්‍රික්කය

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 02 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජූනි 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 05 දින නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 මතය.
---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
---------------------------------------

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.751,387ක විනෝද බදු ලැබීම් රු.25,000ක් ලෙස දක්වා තිබුණි.

(ආ). 2011 සිට 2014 දක්වා ත්‍යාග හා ආධාර වශයෙන් ලැබී තිබූ රු.579,675ක මුදල් ආපසු ගෙවිය යුතු තැන්පත් ලෙස 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඇ). යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවල 2012 වර්ෂයේ ආරම්භක ශේෂය රු.81,000කින් වැඩියෙන් සටහන්වීම හා මිලදීගැනීම්වල වටිනාකම රු.350,745ක් වැඩියෙන් සටහන්වීම සමාලෝචිත වර්ෂයේදීත් ගිණුම්වල නිවැරදි කර නොතිබුණි.

(ඇ). 2013 වර්ෂයේදී වෙන්දේසි කරන ලද රු.1,063,193ක් වටිනා භාණ්ඩ හඳුනාගෙන ඒවායේ අගයන් ලේඛන සහ වත්කම් ගිණුම්වලින් ඉවත්නොකර වෙන්දේසියෙන් ලද මුදල පමණක් වත්කම්වලින් අඩුකර දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.992,624ක් වටිනා ජංගම වැසිකිළි 09ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.

----------------------------

ගිණුම් විෂයයන් 05කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.66,735,935ක් වූ අතර, උපයෝගී ලේඛණ, අනුව එම ගිණුම්වල ශේෂයන්ගේ එකතුව රු.66,568,903ක් වූයෙන් රු.167,032ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

--------------------

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02ක එකතුව රු.17,806,983ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.1,289,707ක් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

ඉකුත් වර්ෂයේ ගැළපුම් ලෙස දක්වා තිබූ රු.88,237,628ක වටිනාකම තහවුරු කරගැනීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.5 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| i. මු.රෙ. 343 | 2010 වර්ෂයේ සිට 2014 දක්වා අවස්ථා 09කදී නිලධාරීන් 08 දෙනෙකු විසින් භාරගත් කුවිතාන්සි පොත් 09ක් ආපසු භාරදී නොතිබුනි. |

| | | |
|---|---|---|
| ii. | මු.රෙ. 371 | අවස්ථා 02කදී ලබාදී තිබූ රු.49,472ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| iii. | මු.රෙ. 395 | 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ 2015 ජූලි වන විටද පිළියෙල කර නොතිබුණි. |
| iv. | මු.රෙ. 571 | අවස්ථා 07කදී තැන්පත් කර වර්ෂ 02ක් ඉක්මවා ඇති රු.269,674ක් වටිනා තැන්පතු නීයාදනය කර නොතිබුණි. |
| v. | මු.රෙ. 757 (ආ) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාරතා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | ස්වේච්ඡා සංවිධානවලට කොන්ත්‍රාත් පිරිනැමීමේදී එකවර සමිතියකට ලබාදිය හැකි වැඩ ප්‍රමාණ 03ක් සහ ඒවායේ වටිනාකම රුපියල් මිලියන 02ක නොඉක්මවිය යුතුය යන කොන්දේසිය කඩ කරමින් රුපියල් මිලියන 04ක් වටිනා කර්මාන්ත 05ක් එකම සමිතියක් වෙත ලබාදී තිබුණි |
| (ඇ) i. | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය XXIV වැනි පරිච්ඡේදය 40 වගන්තිය | සේවය හැරගොස් ඇති නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.461,623ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) i. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2007 මැයි 05 දිනැති අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකුට චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.180,000ක මුදලක් සහා අරමුදලින් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| ii. 2014 දෙසැම්බර් 11 දිනැති අංක 25/2014 දරන චක්‍රලේඛය | දින 180ක සේවා කාලයක් නොමැති සේවකයින් 31 දෙනෙකුට ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.90,844,015ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.104,745,297ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.13,901,282ක පිරිහීමක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමඟ සැසඳීමේදී රු. 13,901,282ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා ආදායම් විෂයයන් 02ක අඩුවීම හා වියදම් විෂයයන් 05ක වැඩිවීම මූලික වශයෙන් හේතුවී තිබුණි.

i. සභාවේ වැටුප් හා වේතන වියදම රු.26,064,347කින් වැඩිවන විට වැටුප් ප්‍රතිපූර්ණ රු.12,422,122කින් අඩුවීමට මූල්‍ය ප්‍රතිඵලය රු.36,486,469කින් පහත වැටීමට හේතුවී තිබුණි.

ii. බදුකුලී ආදායම රු.50,117,700කින් අසාමාන්‍ය ලෙස ඉහළ යාමට නව සාප්පු සංකීර්ණය බදුදීමේදී ලබාගත් රු.41,225,000ක ටෙන්ඩර් මුදල හේතුවී තිබුණි.

2.3. ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය.

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2014.01.01 දිනට හිඟය | 2014 වර්ෂයේ බිල්කිරීම් | අයකළ යුතු මුළු මුදල | වර්ෂයේ අයකිරීම් බිල්කිරීම්වලින් | වර්ෂයේ අයකිරීම් හිඟයෙන් | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | රු. | රු. | රු. |
| වරිපනම් | 61,758,084 | 38,377,645 | 100,135,729 | 18,316,200 | 18,650,658 | 63,168,871 |
| බදු කුලී | 426,500 | 32,552,336 | 32,978,836 | 17,832,646 | 10,449,745 | 4,696,445 |
| බලපත්‍ර ගාස්තු | 852,500 | 12,252,966 | 13,105,466 | 12,244,966 | 17,000 | 843,500 |
| ජල ගාස්තු | 18,633,351 | 39,378,549 | 58,011,900 | 26,342,961 | 10,961,250 | 20,707,689 |

2.3.2 වරිපනම් බදු

(අ) සභාව වසර 07කට අධික කාලයක් වරිපනම් බදු තක්සේරුකර නොතිබූ අතර, ඒ හේතුවෙන් කාමර 101කින් සමන්විත සංචාරක හෝටලයක් ඇතුළු දේපළ විශාල සංඛ්‍යාවකින් වරිපනම් බදු අයනොවන බව විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට එක් දේපළකින් රු.100,000ට වඩා හිඟ වරිපනම් බදු මුදල් අයවිය යුතු දේපළ 44ක් පැවතියද, එම හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

(ඇ) මහා සභාවේ යෝජනා සම්මතයක් ලබා නොගෙන ආදායම් පරීක්ෂකවරයාගේ නිර්දේශය සහ ගණකාධිකාරීවරයාගේ අනුමැතිය මත සංචාරක හෝටලයකින් අයවිය යුතු රු.73,320ක වරෙන්තු ගාස්තු කපාහැර තිබුණි.

2.3.3 ඉඩම් බදු

සභාවේ ලේඛන අනුව ඉඩම් කැබලි 178ක් බදුදී තිබුණු අතර, බදු ගිවිසුම් හා කොන්දේසි අනුව 2014 දෙසැම්බර් 31 දිනට ඉන් ඉඩම් කැබලි 170කින් අයවිය යුතු බදු මුදල රු.15,396,722ක් විය. මෙම හිඟ කුලී වසර 02 සිට 20කට වැඩි කාලයක් දක්වා කාලයකට අදාළ වන අතර, වර්ෂ 10කට අධික කාලයකින් ඉඩම් තක්සේරුකර බදු සංශෝධනය කර නොතිබුණි.

2.3.4 කඩකුලී

i. සභාව සතු කඩකාමර 463ක කුලිය 2009 වර්ෂයේ තක්සේරු කර තිබුණද, එම තක්සේරු කුලී අයනොකර සභා තීරණ මත කලින් අයකළ කුලියට සියයට 25ක් එකතුකර අයකිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමිවී තිබුණි.

ii. ගිවිසුම් ප්‍රකාරව කඩකුලී අයකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.31,788,478ක හිඟ කඩකුලී අයකරගත යුතුව පැවතුණි.

2.3.5 ප්‍රචාරන දැන්වීම් පුවරු ගාස්තු.

---------------------------------

සභාව සම්මතකර ඇති අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව 2014 වර්ෂයේ සිට 2015 අප්‍රේල් දක්වා සභා බලප්‍රදේශය තුළ ඉදිකර තිබුණු ප්‍රචාරන දැන්වීම් පුවරු 190කින් අයවිය යුතු රු.3,482,312ක මුදලක් අයකරගෙන නොතිබුණි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 318,038 |
| මුද්දර ගාස්තු | 12,976,421 |
| | ------------- |
| එකතුව | 13,294,459 |
| | ======== |

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම

----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම තහවුරු කරගැනීම සඳහා භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). පෞද්ගලික ආයෝජකයෙකු විසින් 2011 වර්ෂයේ සිට ග්‍රෙගරි උද්‍යානයේ පවත්වාගෙන ගිය පාපැදි කුලියටදීමේ ව්‍යාපෘතිය තුලින් දළ වශයෙන් වර්ෂයකට රු.2,000,000ක පමණ අදායමක් උපයාගෙන තිබුණි. එහෙත් 2014 වර්ෂයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලැබිය යුතු ආදායමින් 100%ක කාර්යය සාධන සුරක්ෂණ ඉල්ලීම හේතුවෙන් අදාළ ආයෝජකයා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණු අතර සභාවට විශාල මූල්‍ය අලාභයක් සිදුවී තිබුණි.

(ආ). නුවරඑළිය මහා නගර සභාවේ නව කාර්යාල සංකීර්ණයට යාබදව රු.5,922,189ක් වැයකරමින් ඉදිකළ කඩකාමර 16ක් අදාළ ඉදිකිරීම් සමාගම වැඩ නිමකර 2013 සැප්තැම්බර් මස 16 වන දින සභාවට භාරදී තිබුණු නමුත් එම කඩ කාමර මිල ගණන් කැඳවා කුලියටදීමට 2014 දෙසැම්බර් 31 වන විටද කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු PB-8678 දරන මයික්‍රෝ වර්ගයේ කැබ් රථය අළුත්වැඩියාව සඳහා රු.715,446ක මුදලක් නිෂ්පාදන ආයතනය වෙත ගෙවා වසරකුත් මාස 04ක් ගතවී තිබුණද, වාහනය අළුත්වැඩියාකර භාරදී නොතිබුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

#### 3.3.1 ගබඩා පාලනය

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(i). ගබඩා ලැබීම්/ නිකුත්කිරීම් පිළිබඳ ලෙජරයක් ස්වාධිනව නිලධාරියෙකු විසින් ගිණුම් අංශයේ පවත්වාගෙන නොතිබු අතර සියළු ලැබීම් සහ නිකුත්කිරීම් ගබඩා භාරකරු විසින් ගබඩා ලෙජරයේ පමණක් සටහන් තැබීම හේතුවෙන් ගබඩා පාලනය සම්බන්ධ අභ්‍යන්තර පාලනය බිඳවැටී තිබුණි.

(ii). 2011 වර්ෂයේදී මිලදීගත් රු.448,500ක් වටිනා වැහිකබා 230ක් සහ එම වර්ෂයේදී ශ්‍රෙගරිවැව අලංකරණය සඳහා යොදාගත් රු.744,750ක් වටිනා විදුලි බල්බ 135ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව ගබඩාවේ පැවතුණි.

(iii). නුවරඑළිය මහා නගර සභාවේ මාතෘ සායනය සඳහා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු යකඩ ෆෝලේට් ඖෂධ පෙති 178,000ක් සමාලෝචිත වර්ෂය තුලදී කල්ඉකුත්වී තිබුණි.

(iv). ගබඩා ලේඛණ අනුව රු.50,000ක් වටිනා 4'x8' ප්‍රමාණයේ "සෙප්ට්‍රින්" වර්ගයේ ජල ටැංකියක් නුවරඑළිය මැතිවරණ කාර්යාලය වෙත ලබාදුන් බව ගබඩා භාරකරු සඳහන් කළද ඒ වෙනුවෙන් මුදල් හෝ ලැබීම් නියෝග හෝ ලැබී නොතිබුණි.

(v). වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් වටිනාකම රු.17,170,750ක් වූ පොදු ගබඩා ශේෂය සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට විගණනයේදී නොහැකිවිය.

3.3.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ). මහ නැගුම ව්‍යාපෘතිය යටතේ මාර්ග 05ක් සඳහා අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇතිරීම සඳහා ලැබුණු රු.4,000,000ක ප්‍රතිපාදනවලින් කර්මාන්ත සඳහා අවම වශයෙන් කුට්ටිගල් 66,400ක් ඇතිරිය යුතු බවට වූ කොන්දේසියක් පනවා තිබුණි. එහෙත් සභාව එය නොසලකා ඇස්තමේන්තු සකස්කර කුට්ටිගල් 41,253ක් ඇතිරීම හේතුවෙන් රු.868,968ක මුදලක් සභාවට අහිමිවී තිබුණි.

(ආ). ගොල්ෆ් වීව් වෙළඳසංකීර්ණය ඉදිකිරීම සඳහා මූලික සැලසුම් සහ ඇස්තමේන්තු වෙනුවෙන් උපදේශන සමාගමක් වෙත රු.3,000,000ක් ගෙවා වසර 09ක කාලයක් ගතවී තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි කටයුතු ආරම්භ කර නොතිබුණි.

3.3.3 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත විස්තර සඳහන් වාහන සහ වත්කම් වසර 05කට අධික කාලයක් ඌණ උපයෝජිතව පැවතුණි.

| විස්තරය | භාවිතයෙන් ඉවත්කර ඇති කාලය |
| --- | --- |
| 27 ශ්‍රී 4934 දරන ලොරි රථය | වසර 10කට අධික කාලයක් |
| රෝද 04 ට්‍රැක්ටර් 03 | වසර 05කට අධික කාලයක් |
| යතුරු පැදි 04 | වසර 10කට අධික කාලයක් |
| වතුර බවුසර් 03 | වසර 10කට අධික කාලයක් |
| විදුලි ට්‍රාන්ස්ෆෝමර් 04 | වසර 10කට අධික කාලයක් |
| පෙර පාසල් උපකරණ කොටස් | වසර 05කට අධික කාලයක් |
| පී.වී.සී. බෙන්ඩ් (මි.මී 225ට වැඩි) | වසර 10කට අධික කාලයක් |

3.3.4 හඳුනාගත් පාඩු

2014 වර්ෂයේ අප්‍රේල් මස සිට ජූලි දක්වා ග්‍රෙගරි උද්‍යානයේ පාපැදි කුලී අයකිරීම සඳහා නිකුත් කළ පොත් 07ක ප්‍රවේශ පත් 368ක් සඳහා සභාවට අයවිය යුතු රු.36,800ක මුදලක් අයකරගෙන නොතිබුණි.

3.3.5 නෛතික වියදම්

උප නගරාධිපතිවරයා නිවාඩු අනුමත කරවාගෙන සභා වාර 03කට සහභාගී නොවීම මත ධූරයෙන් ඉවත්කිරීම සඳහා ගනු ලැබූ තීරණයක් අභියෝගයට ලක්කරමින් උප නගරාධිපතිවරයා විසින් නගරාධිපතිවරයාට සහ සභාවට එරෙහිව පැවරූ නඩුවකට සභාව වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහා නීතිඥ ගාස්තු ලෙස රු.1,680,500ක මුදලක් සභා අරමුදලෙන් වියදම් කර තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අයවැය ලේඛණයේ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා සැපයුම් හා උපකරණ ශීර්ෂයෙහි රු.24,018,423ක වියදමක් දරා ඇතත් ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ). ආදායම් ශීර්ෂ 06කට අයත් උප විෂයයන් 17ක් සඳහා ඇස්තමේන්තුගත කළ රු.1,440,000ක් වූ ආදායම් අයවීමේ ප්‍රතිශතය 0%ක් වී තිබුණි.

(ඇ). අයවැයගත ආදායම් ශීර්ෂ 03කට අයත් උප අය විෂයයන් 04ක 79% සිට 97% දක්වා පරාසයක ඉලක්කගත ආදායම් උපයාගැනීමට සමත්වී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 05ක සියයට 17සිට සියයට 86 දක්වාද වියදම් විෂයයන් 05ක සියයට 10 සිට සියයට 60 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්
---------------------------------------------------------
2014 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 15 කට පිළිතුරු සපයා නොතිබුණු අතර ඒවායේ ගණනය කළහැකි වටිනාකම රු.52,805,747ක් විය.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------
සභාවේ මිලදීගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

4.4 විගණනය හා කළමනාකරණ කමිටු පැවැත්වීම
---------------------------------------------------
ආයතනය තුළ විගණනය හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.5 අභ්‍යන්තර විගණනය
-----------------------
ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන.
--------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). ආදායම් පරිපාලනය

(ආ). අභ්‍යන්තර පාලනය

(ඇ). ණයගැති ණයහිමි පාලනය.

(ඇ). වත්කම් කළමනාකරණය

(ඉ). තොග පාලනය.